නිපුණතාව 6 - සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය විග්‍රහ කරයි.

නිපුණතා මට්ටම 6.4 - සමාහාර ඉල්ලුමේ සංරචක වෙනස්වීම මත සාර්ව ආර්ථික සමතුලිතය වෙනස්වීම් ගුණක ක්‍රියාවලිය ඇසුරෙන් පෙන්වා දෙයි.

1. එක්තරා ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික විචල්‍ය කිහිපයක් පහත දැක්වේ.

- ස්වාධීන පරිභෝජනය 100
- ආදායමේ වැඩි වන සෑම රුපියලකින්ම ශත 10ක් ඉතුරු කරයි.
- ආයෝජන 500
- රජයේ වියදම 500
- රජයේ බදු ආදායම 200

ඉහත තොරතුරු භාවිත කරමින් පහත දැක්වෙන ප්‍රකාශවලට පිළිතුරු සපයන්න.

I. පරිභෝජන හා ඉතුරුම් ශ්‍රිත ගොඩනගන්න.
II. සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.
III. සමතුලිත ජාතික ආදායම තීරණය වන ආකාරය ප්‍රස්තාර සටහනකින් පෙන්වන්න.
IV. බදු ආදායම රුපියල් 100කින් වැඩි කිරීමට තීරණය කළේ නම් නව සමතුලිත ජාතික ආදායම කොපමණද?
V. බදු ගුණකය ප්‍රස්තාර සටහනකින් පැහැදිලි කරන්න.